# බත්කූරා ගේ නුවණ



එච්.එම්. ලිතුම්සා ලෙෂාදි හේරත්

Scanned with
CamScanner

# බත්කූරාගේ නුවණ

කතෘ :- එච්.එම්. ලිතුම්සා ලෙෂාදි හේරත්

චිත්‍ර :- එච්.එම්. ලිතුම්සා ලෙෂාදි හේරත්

**කතෘගේ වෙනත් කෘති**

- ආඩම්බර රෝස පඳුර
- දළඹු පැංචාට පාඩමක්

මහාමායා බාලිකා විදුහල

3 ශ්‍රේණිය ඩී

ISBN - 978-624-211-004-2



Scanned with CamScanner

# පිදුම

වසර දෙකක කාලයක්

මා හට අකුරු කරන්නට

සෙවණ දුන්

ආදරණීය

මහාමායා බාලිකා විදුහල් මැණියන්ට

සෙනෙහසින්

පුදන්නෙමි ..... !!!



Scanned with CamScanner



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

CamScanner

Scanned with CamScanner

එදා ලස්සනට ඉර පායලා කැළෑවේ සතුන් එහෙ මෙහෙ කෑම සොයමින් ඇවිදිනවා.

කැළෑවේ මල් ලස්සනට පිපිලා.

ඒ ලස්සන බලමින් පුංචි බත්කූරා කෑම සොයා පියෑඹුවා.



Scanned with CamScanner

බාදුරා පඳුරකට

පිණි බිංදු වැටිලා

ලස්සනට දිළිසුණා.



බාදුරා ගස ඇතින් එන බත්කූරා දැක්කා.



Scanned with CamScanner



"ආ ....... කොහොමද බත්කූරෝ"

බාදුරා පදුර ඇසුවා.

බත්කූරා එක පාරටම බාදුරා පදුර දෙස බැලුවා.

අනේ ....! මට කතා කරන්නේ කවුද?

"එයා හොඳ කෙනෙක් වෙන්න ඇති"

බත්කූරා සිතුවා.

Scanned with CamScanner

"එන්න, එන්න,

මා ළඟ පැණි බඳුනක් තියෙනවා.

ඔයාට ඕන තරම් ගන්න පුළුවන්"

බාඳුරා පඳුර කිවුවා.



ගොඩක් යාළුවෝ මගේ බඳුනෙන්

පැණි අරන් යනවා.

ඉතිං ඔයත් එන්න.

බාඳුරා පඳුර ආයෙත් කිවුවා.

Scanned with CamScanner


බාදුරා පදුරේ කතාව
ඒ අසලින් ගිය
මී මැස්සෙකුට ඇසුණා.
මී මැස්සා මෙහෙම සිතුවා.
“මොනවා. ! පැණි බඳුනක් තියෙනවා ........?”



Scanned with CamScanner

බත්කූරාට කලින්ම
මී මැස්සා බාඳුරා පඳුරේ
පැණි බඳුනට ඇතුල් වුණා.




බත්කූරා හදිසි වුනේ නැහැ.
බත්කූරා මෙම සිදුවීම දෙස
හොඳින් බලා ගෙන සිටියා.

Scanned with CamScanner

මී මැස්සා පැණි බඳුනට

ඇතුල් වූ විටම

බඳුනේ පියන වැසුණා.



Scanned with CamScanner

"අනේ.....! මී මැස්සා

බඳුනේ හිර වුණා නේද ?"

බත්කූරාට කියවුණා.



මී මැස්සාට

නැවත එන්න බැරිවුණා.

Scanned with CamScanner



බත්කූරා බාදුරා පදුරේ
නපුරු බව තේරුම ගත්තා.
ඉක්මනින්ම ආපසු පියාඹා
ජීවිතය බේරා ගත්තා.

ඉතිං පුංචි අපිත් බත්කූරා මෙන්
සෑම විටම ඉවසීමෙන්,
සොයා බලා
කටයුතු කරමු.

# ස්තුතිය

මාව පුංචි කතුවරියක් කළ මහනුවර මහාමායා බාලිකා විදුහලේ විදුහල්පතිතුමියටත්, ප්‍රාථමික අංශයේ විදුහල්පතිතුමිය හා පංතිභාර ගුරුතුමිය වන වත්සලා ගුරු මෑණියන්ටත්, මාගේ අනෙකුත් සියළුම ගුරුමෑණිවරුන්ටත්, පියවරුන්ටත්, ආදරණීය අම්මා, තාත්තාටත් මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි


Scanned with CamScanner

# පසුවදන



අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමුලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නුතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

Scanned with CamScanner